# චන්ද්‍රිකා කුමාරතුංග හා සිංහල නායකත්වය

ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නෝර්වේ තානාපති සම්බන්ධයෙන් පියවරක් පස්සට ගෙන ඇත. කොටි සංවිධානයට තම තානාපති වරප්‍රසාද යොදා ගනිමින්, ආණ්ඩුව නමින් පවත්වාගෙන යන පරිපාලන ව්‍යුහයේ අනුදැනුම සහිතව, අධිසංවේදී ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ තීරු බදු රහිතව ගෙන්වා දුන් තානාපති වෙස්ට්බර්ග්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාධිපතිනිය නෝර්වේ අගමැතිවරයාට දැනුම් දුන්නාය. එහෙත් ඉන්පසු ඇය ඒ ගැන කතා කිරීම අත්හැර දමා ඇති අතර ඇගේ ප්‍රවෘත්ති ප්‍රකාශක ලෙස කටයුතු කරන හරීම් පීරිස් මහතා ඒ සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලදී පිළිතුරු දී ඇති ආකාරයෙන් ඇය පියවරක් පස්සට ගෙන ඇති බව තහවුරු කර ඇත. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය වටා සිටින උපදේශකවරු ඇයට වැරදි උපදෙස් දෙන බව බොහෝ විට පෙනී ගොස් ඇති කරුණකි. එසේම ඇය බටහිර රටවල බලපෑම්වලටද යටත්ව බොහෝ විට කටයුතු කරන බැව් පැහැදිලිය. ඇගේ උපදේශකයෝ බොහෝ දෙනෙක් සිංහල බෞද්ධ සංස්කෘතිය හා ඉතිහාසය ගැන එතරම් අවබෝධයක් නැත්තෝ වෙති. ඔවුන් බොහෝ විට ක්‍රියා කරන්නේ බටහිර ක්‍රිස්තියානි රටවල නියෝජිතයන් ලෙසය. මෙයින් අදහස් කරන්නේ මොවුන් හා බටහිර තානාපති කාර්යාල අතර සම්බන්ධයක් තිබෙන බව නොවේ. සිංහල සංස්කෘතියේ නාග ධාරාවට අයත් මොවුහු ඉහළම අනුකාරකයෝ වෙති. තමන් ලත් අධ්‍යාපනය හේතුකොටගෙන ඔවුහු බටහිරයන්ට අවශ්‍ය ආකාරයට සිතති. ඔවුන්ට අවශ්‍ය වන්නේ තම බටහිර ස්වාමීන් සතුටු කිරීමට නොහැකි නම් අඩුම තරමින් අසතුටු නොකර සිටීමටය.

නෝර්වේ අගමැතිවරයා ජනාධිපතිනියගේ ලිපියට යන්නෙ කොහෙද මල්ලෙ පොල් වර්ගයේ පිළිතුරක් එවා ඇත. ඒ ප්‍රශ්නය එතැනින්ම කෙළවර වන බව පැහැදිලිය. මෙය මෙසේ සිදු වූයේ ඇයි? අප රටේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගසන වෙස්ට්බර්ග් අද මෙරට පාලකයා මෙන් ක්‍රියා කරයි. රෙඩ් බානා නම් ඊනියා රාජ්‍ය නොවන සංවිධානයේ ප්‍රධානියාව සිටි අවධියෙහි වතු දෙමළ කම්කරුවන් වවුනියාවේ හා ඒ අවට ප්‍රදේශවල පදිංචි කරවමින් ජන අනුපාතය වෙනස් කිරීමට කටයුතු කළ ඔහු තානාපති ලෙස පත් නොකළ යුතුව තිබුණි. එක්දහස් නවසිය පණස් ගණන්වලින් පසුව තමන්ගේ මුතුන් මිත්තන් වාසය කළ නැගෙනහිර පළාතේ ප්‍රදේශවල සිංහලයන් පදිංචි කරවීම ගැන ඊනියා ප්‍රබුද්ධයන් ඇතුළු දෙමළ ජාතිවාදීහු නිරතුරුව කතා කරති. ඒ ප්‍රදේශවලින් සිංහලයන් ඉවත් කළ යුතු යැයි ඔවුහු කියති. එහෙත් නෝර්වේ අනුග්‍රහයෙන් වවුනියාවේ පදිංචි කළ දෙමළ ජනයා ගැන කිසිවෙක් කතා නොකරති. මෙරට දෙමළ ජනයා සියලු දෙනාම පාහේ අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍ය තාවයට විවිධ ප්‍රදේශවල පදිංචි කරනු ලැබුවන්ගෙන් පැවත එන්නෝ වෙති. යාපනයේ වැසි බොහෝ දෙනෙක් ලන්දේසි යුගයේ දුම්කොළ වැවීම සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙන්වනු ලැබුවන්ගෙන් පැවත එති. නැගෙනහිර පළාතේ දෙමළ ජනයාගේ සම්භවය බ්‍රිතාන්‍ය යුගයෙන් ඈතට නොයයි. ඔවුන් එහි පදිංචි කරවනු ලැබුයේ ප්‍රධාන වශයෙන්ම බ්‍රිතාන්‍යයින් විසිනි. බ්‍රිතාන්‍යයින් දෙමළ ජනයා එහි පදිංචි කරවීමට පෙර 1817-18 නිදහස් සටනින් පරාජය වූ සිංහලයෝ එහි ඇතැම් ප්‍රදේශවල සමූලඝාතනය කරනු ලැබූහ. සිංහලයන් නැවත එම පෙදෙස්වල පදිංචි කිරීමට විරුද්ධ වන්නෝ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යන්නෝ වෙති. වතුකරයේ දෙමළ ජනයා වෙළෙඳ බෝග වැවීම සඳහා බ්‍රිතාන්‍යයින් විසින් දකුණු ඉන්දියාවෙන් ගෙන්වනු ලැබුවන්ගෙන් පැවත එති. කොළඹ හා ඒ අවට ප්‍රදේශවලට දෙමළ ජනයා ගෙන එනු ලැබුයේ බ්‍රිතාන්‍ය පරිපාලන අවශ්‍යතාවයන් සඳහාය. මෙලෙස බැලූ කල ඊනියා දෙමළ නිජබිම්වලත් අනෙක් පෙදෙස්වලත් දෙමළ ජනයා පදිංචි කරවනු ලැබ ඇත්තේ බටහිරයන් විසිනි. එහෙත් මේ ගැන බටහිරයෝ හා ඊනියා ප්‍රබුද්ධයෝ කතා නොකරති.

අද නෝර්වේ යනු මෙරට පාලකයා මෙනි. නෝර්වේ තානාපති එකල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා මෙන් කටයුතු කරයි. අද මෙරට පවතින්නේ ඔහුගේ ආණ්ඩුවක් යැයි කිව හැකිය. උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් සියල්ල සිද්ධවන්නේ ඔහුගේ කැමැත්ත පරිදිය. රටේ ජනතාවගේ කැමැත්ත කුමක් දැයි දැන ගැනීමට ඊනියා ආණ්ඩුවට අවශ්‍ය නැත. කුමාරතුංග මහත්මිය වෙස්ට්බර්ග්ගේ පිළිබඳව නෝර්වේ අගමැතිට ලිපියක් යැවුවේ අහවල් දේකට ද? ඇයට වෙස්ට්බර්ග්ගේ අකටයුතු ගැන නෝර්වේ අගමැතිට ලිපි යවනවා වෙනුවට කෙළින්ම වෙස්ට්බර්ග් එරට අගමැති වෙත යැවීමට තිබුණි. එපමණක් නොව අප කලින් කියා ඇති පරිදි ඇය කළ යුතුව තිබුණේ නෝර්වේ සමග ඇති තානාපති සබඳකම් අත්හිටුවීමය. එහෙත් ඇය ඒ කිසිවක් නොකළාය. ඇය කෙළේ ඇගේ පෙළැන්තියේ මුතුන් මිත්තන් අනුගමනය කරමින් නෝර්වේ අගමැතිට පෙත්සම් යැවීමය.

© Prof. Nalin De Silva

සිංහලයන්ගේ එක් කරුමයක් වී ඇත්තේ ඔවුන්ට ඔවුන්ගේ නායකයන් නොමැති වීමය. අද ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකේම නායකත්වය හිමි වී ඇත්තේ ඉංගිරිසින් විසින් අපට දෙන ලද නායකයන්ගෙන් පැවතෙ න්නවුන්ටය. 1817-18 නිදහස් සටනින් පසුව සිංහලයන්ගේ සාම්ප්‍රදායිකත්ව නායකත්වය මුළුමනින්ම මෙන් නැති කළ ඉංගිරිසිහු ඉඩම්, තනතුරු හා වරප්‍රසාද දී අලුත්ම නායකත්වයක් සිංහලයන්ට ඇති කළහ. ඒ නායකත්වය සිංහලයන් මත ඉංගිරිසින් විසින් පටවන ලද්දකි. ඉංගිරිසින් විසින් ඇති කරනු ලැබූ නායකයෝ තම ස්වාමීන්ට කත් ඇද්දෝය. ඔවුහු ආගමෙන් ඇංගලිකන් ක්‍රිස්තියානි වූ අතර, යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් වූහ. ඔවුන්ගේ බස ඉංගිරිසිය විය. තමන් සිංහල නොදන්නා බව ඔවුන්ගේ ආඩම්බරයට හේතු විය.

මේ ඊනියා නායකයෝ සිංහලයන්ගේ සාම්ප්‍රදායික නායකයන් මෙන් නොව බහුතර ජනතාවගෙන් ඈත් වූ මහේශාක්‍ය පිරිසක් වූහ. ඔවුන්ට බහුතර ජනතාව සමග සම්බන්ධයක් නොවීය. එහෙත් ඉංගිරිසිහු ඔවුන් සිංහලයන්ගේ නායකයන් ලෙස සැලකූහ. මේ ඉංගිරිසින් විසින් පත් කරන ලද නායකයන් තරම් සුවච කීකරු සේවකයන් පිරිසක්, කණ්ඩායමක් ලෙස ගත් කළ, ඉංගිරිසින්ට අධිරාජ්‍යයේ වෙනත් කිසිම තැනක නොසිටි බව පැහැදිලිය. ඉංගිරිසින් මෙරට හැඳින්වූයේ තම ආදර්ශී යටත්විජිතය ලෙසය. මේ නිවට නායකයන්ගෙන් තමන්ට කිසිම කරදරයක් නොවන බව ඉංගිරිසිහු දැන සිටියහ.

නිවට නායකයෝ කිසිම දිනෙක ඉන්දියාවේ හෝ මියන්මාරයේ හෝ මෙන් බහුජන නිදහස් සටනක් ආරම්භ කිරීමට උත්සාහයක් නොගත්හ. 1848 න් පසුව එලෙස බහුජන නිදහස් ව්‍යාපාරයක් ගොඩනැගීමට උත්සාහ කළ අවසාන නායකයා ලෙස සැලකිය අනගාරික ධර්මපාල තුමා පරාජය කිරීමට නිවට නායකයෝ ඉංගිරිසින් සමග අත්වැල් බැඳගත්හ. සිංහලයන්ගේ අවසන් නිදහස් සටන අසාර්ථක වූයේ අද ද ධර්මපාලතුමාට මඩ ගැසීමට ඉදිරිපත් වන රාජ්‍ය නොවන සංවිධානවල හා විශ්වවිද්‍යාලවල සිටින ඇතැම් උගතුන් කියන ආකාරයට එතුමා සිංහලයන්ට පමණක් ආමන්ත්‍රණය කිරීම නිසා නොව ඉංගිරිසින් විසින් ඇති කරන ලද නිවට නායකයන් එතුමාට විරුද්ධව ඉංගිරිසින්ගේ පැත්ත ගනිමින් ක්‍රියා කළ බැවිනි. මේ නිවටයෝ ඩී. බී. ජයතිලක මහතා වැන්නන්ද මුලදී තම අවශ්‍යතා වෙනුවෙන් යොදා ගත්හ. දුටුගැමුණු රජතුමා මෙන්ම ධර්මපාලතුමාද අගෞරවයට පත් කිරීමට මේ නිවට නායකයන්ට විරුද්ධ යැයි කියන ඊනියා ප්‍රබුද්ධයන් ඉදිරියට එන්නේ ඒ "ප්‍රබුද්ධයන්" ද බටහිරයන්ගේ නිවට නියාළු ඇම්බැට්ටයන්ම පමණක් වන බැවිනි. නිවට නායකයන්ට පූර්ණ නිදහසක් අවශ්‍ය නොවීය. ඉන්දියාවේ මෙන් ස්වරාජ්‍යයක් සඳහා සටනක් මෙරට නොවීය.

ඉංගිරිසින් විසින් පත් කරන ලද නායකයන්ට අවශ්‍ය වූයේ සීමිත නිදහසකි. ඒ සඳහා ඔවුන් තෝරා ගත් උපක්‍රමය වූයේ පෙත්සම යැවීමය. ඉංගිරිසි ආණ්ඩුකාරයන්ගේ දරදඬු ක්‍රියා ගැන මේ නිවටයෝ ඔවුන් සැලකූ ආකාරයට උතුම් වූ ඉංගිරිසි ආණ්ඩුවට පෙත්සම් මගින් කරුණු ඉදිරිපත් කළහ. ඔවුන්ට අනුව ආණ්ඩුකාරයකු වරදක් කළද එංගලන්තයේ මහ රජ්ජුරුවන්ගේ ඉංගිරිසි ආණ්ඩුව වරදක් නොකළේය. ඉංගිරිසි ආණ්ඩුවෙන් යුක්තිය ඉටු වනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වූහ. ඒ ගැන ඔවුන්ට කිසිදු සැකයක් නොවීය. ඔවුන්ට අවශ්‍ය වූයේ ඔවුන් සුද්දන්ටද වඩා හොඳ සුද්දන් බව පෙන්වා එමගින් සීමිත නිදහසක් දිනා ගැනීමටය. ඊනියා ඔක්ස්ෆඩ් උච්චාරණය අනුව තමන් ඉංගිරිසි කතා කරන්නේ යැයි ඔවුහු මහත් අභිමානයෙන් කියා සිටියහ. ඉන්දීය හා මෙරට දෙමළ ජනයා ඉංගිරිසි උච්චාරණය කරන ආකාරය ගැන ඔවුහු සිනාසුණහ. අද පවා බොහෝ සිංහලයන්ට ඉංගිරිසි ඉගෙන ගැනීමට බාධාවක් වී ඇත්තේ ඉංගිරිසි උච්චරණය සම්බන්ධයෙන් තමන් අතින් වරදක් වී ලජ්ජා වීමට සිදු වේය යන බියය. මේ ලජ්ජාව ඇති කෙළේ මෙරට ඉංගිරිසි උගත් කසිකබල් නායකයන් හා ඔවුන් අනුව ගිය සෙසු පිරිස්ය. සුද්දන්ගේ කෑම මේස සිරිත් විරිත් අකුරක් පාසා අනුකරණය කළ නිවට නායකයන්ට හා සෙස්සන්ට ප්‍රවාද හා සංකල්ප නිර්මාණය සුද්දන්ගෙන් ඉගෙන ගැනීමට නොහැකි විය. ඉංගිරිසි සංස්කෘතියෙහිද මොවුන් අගය කෙළේ පිටපොත්ත පමණය.

මේ නායකයන් ගැන අනගාරික ධර්මපාලතුමාට අවබෝධයක් විය. අවුරුදු අසූවකට පමණ පෙර මේ කළු සුද්දන්ගේ නායකත්වය ගැන එතුමා අනතුරු ඇඟවීමක් කෙළේ එබැවිනි. කළු සුද්දන් ගැන ඉංගිරිසීන් කෙතරම් පැහැදී සිටියේද කිවහොත් අධිරාජ්‍යයේ වෙනත් සුදු නොවන රටකට සර්වජන ඡන්දය දීමට පෙර අපට ඒ ලැබිණි. අනගාරික ධර්මාලතුමාගේ ව්‍යාපාරය එවකට පරාජය කර තිබූ බැවින් හා මාක්ස්වාදීන් යනු කිසිම දිනෙක මෙරට බහුජන ව්‍යාපාරයක් ගොඩ නැංවිය නොහැකි, සංස්කෘතික වශයෙන් තමන්ට විරුද්ධ නැති පිරිසක් බව ඉංගිරිසින් දැන සිටි

© Prof. Nalin De Silva

හෙයින් මෙරටට සර්වජන ඡන්දය දීමට ඉංගිරිසිහු පසුබට නොවූහ. ඡන්දයෙන් පත්වන්නේ තමන් විසින් පත්කරන ලද නායකයන් මිස සිංහලයන්ගේ නායකයන් නොවන බව ඉංගිරිසිහු දැන සිටියහ.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය දන්නේත් මේ නිවටයන්ගේ සම්ප්‍රදාය මිස ධර්මපාලතුමාගේ සම්ප්‍රදාය නොවේ. ඇය අයත් වන්නේ ද එම නිවටයන්ගේ සම්ප්‍රදායටමය. ඇය නෝර්වේ අගමැතිවරයාට නෝර්වේ තානාපති ගැන ලිවීම සිහි ගන්වන්නේ පැරණි නිවට නායකයන් ඉංගිරිසි ආණ්ඩුකාරයාට එරෙහිව ඉංගිරිසි ආණ්ඩුවට පෙත්සම් යැවූ ආකාරයය. එලෙස ලිපි ලිවීම ගැන නෝර්වේ අගමැතිවරයා මෙන්ම වත්මන් බ්‍රිතානි අගමැතිවරයා ද සතුටට පත්වන්නට ඇත. කුමාරතුංග මහත්මිය මේ සම්ප්‍රදායේ අයකු පමණක් නොව තවත් දෝන කතිරිනාවක බව මේ පුවත්පත හරහාම පසුගිය ජනාධිපතිවරණය දිනවල සිටම අප කියා ඇත. එහෙත් රටේ අවාසනාවකට අපට කොනප්පු බණ්ඩාර කෙනෙක් හෙවත් විමලධර්මසූරිය කෙනෙක් නැත. එබැවින් අද සමූහයකට සාමූහිකව විමලධර්මසූරිය වීමේ අවස්ථාව ඇතිවී තිබේ. මුළු මහත් ජාතියෙන් බහුතරයට හෝ මළුපෙ, ජවිපෙ වැනි පක්ෂවල නායකත්වයට හෝ මේ පුරප්පාඩුව පිරවීමට වහාම පියවර ගත හැකිය. නෝර්වේ අගමැතිට පෙත්සම් යැවීමෙන් කළ හැකි දෙයක් නැත. කළ යුතුව ඇත්තේ නෝර්වේ තානාපති කාර්යාලයම ගෙදර යැවීමය. ජනාධිපතිනිය වටා සිටින කසිකබල් උපදේශකවරු අයින් කර බහුතර සිංහලයන්ට අවශ්‍ය ආකාරයට කුමාරතුංග මහත්මිය කටයුතු කරන දිශාවකට ඇය යොමු කරවීමට උත්සාහ කළ යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva